වාර්ෂික සුහද හමුව 2016
Western Night

මහින්ද දිසානායක දිවුල්ගනේ.

වසරක් පාසා බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සමිතිය හා ප්‍රදේශවාසීන් එක්ව සුහද සිතින් සුහදත්වය වර්ධනය කරගැනීමේ අරමුණින් පවත්වනු ලබන සුහද හමුව වෙස්ටර්න් නයිට් :උදිළුරබ හසටයළු* හමුවයි. මෙල්බන් බටහිර ප්‍රදේශයේ ජීවත්වන ශ්‍රී ලාංකික ප්‍රජාවත් විශේෂයෙන් අප පාරමිතා බෞද්ධ විහාරයට සම්බන්ධ සියලු පිරිසක් එකතු වී ඔවුනොවුන්ගේ කාලයකින් අදහස් හුවමාරුකර ගැනීමේ අරමුණින් සංවිධානය කළ මිතුරු හමුව අපේ සුහද හමුවයි. මුලින්ම මෙමම හමුව නම් කලේ ආප්ප රාත්‍රිය නමින්ය. එදා මෙදා තුර කුමන නමකින් නම් කළද ප්‍රාදේශීය මිතුරන්ගේ පවුල්වල හා විහාරස්ථානයේද සම්බන්ධය තුලින් යහපත් සමාජයක් නිර්මාණය වීමයි.

කාලය මහින විට අවුදද්දක් යනු විශාල කාල පරාසයකි. එදා පොඩි දරුවන් වී සිටි දරුවන් අද වන විටදී අධ්‍යාපනය ලබා සමහර විට විවාහ වන වයසේ පසුවෙයි. පෙරදී තරුණ දෙමාපියන් අද දවසේ වැඩිහිටියන් බවට නොදැනුවත්ම පත්වී සිටී. ඒ අනුව මේ සියලු දෙනාට මුනුණ දීමට ඇත්තේ එකම පොදු ප්‍රශ්ණ රාශියකටයි. සම මිතුරන් සමග මේ සියලු දේ සම සමව බෙදා හදා ගත යුතුය. පොදු ප්‍රශ්ණ ඔවුන් සමග කතා බහ කරළ යුතුවේ. එපමණක්ම නොව පුංචි දවස්වලදී සිංහල භාෂා පාසැලේ සුහද කතා බහට සුදුසුම තෝතැන්න වන්නේ මේ වෙස්ටන් නයිට් සුහද හමුවයි. කතාබස් කිරීම පමණක් නොව විනෝදයෙන් පවුලේ සාමට එකතු වී ඒ දිනය ගත කල හැකි සොඳුරු දිනයකි.

මෙම හමුව ආරම්භ වූ දිනවලදී ආප්ප රාත්‍රිය නම් කළද වර්තමානයේදී එය වෙස්ටන් නයිට් යනුවෙන් කාලීනව වෙනස් වූ අතර වෙනදා පැවැත්වූ එකතු වූ ශාලාවද මෙවරද වෙනස් වී ඇත. එනම් North Suihine St. Burnerdate ශාලාව වෙනුවට මෙවර කෝබග් :Corburg) නගර සභා ශාලාව පාවිච්චි කරන්නේ හේතු කීපයක් නිසාවෙනි. ප්‍රථම හේතුව වන්නේ කාලය වැඩි කාලයක් ඔබගේ විනෝදය සඳහා ශාලාවේ කාලවේලාව ලබා ගැනීමේ පරමාර්ථයයි. St Bernnedate ශාලාවේ රාත්‍රී 11 ට අවසන් කළ යුතුය. ඊට වැඩි කාලයක් ඔබගේ විනෝදයට සතුටට ලබාදීමට සංවිධායක මණ්ඩලය මෙවර දැඩි තීරණයක සිටී බැවින් මේ ඉඩකඩ ඇති නගර ශාලාව ලබාගෙන තිබේ. මෙහි රථ නැවැත්වීමේ පහසුකම්ද තිබෙන බව දන්වා සිටිනු කැමැත්තෙමු.

මේ රෙවේදී අපි හැම දෙනෙක්ම ගත කරන්නේ අවිවේකී දිවියකි. අධ්‍යාපනය රැකියාව දරුවන්ගේ කටයුතු ආදී දහසකුත් එකක් කටයුතු වල නියැලී සිටින නිසා දිවිය ඔහේ ගලාගෙන යන විවේකයත්, විනෝදයත්, මිතුරන් සමග කතාබහක් නැත, වැඩවලින් හෙම්බත් වී සිටින යුගයක අවුරුද්දකට වරක් පවත්වන මේ සුහද හමුව කතරකට ඇද වැනෙ අමා වැස්සක් බඳු වේ.
..
මෙදින හමුවට ශ්‍රී ලාංකික ප්‍රණිත වූ ආහාර වේලක පවුලේ හැමට එකතු වී රස විඳීමට හැකිය. ආහාර වේලක රස බලන අතර තුරට නැටුම්, ගැයුම්, වයුම් විද ගැනීමේ අවස්ථාවද උදාවේ. ඒ විතරක් නොව ඇති තරම් නටන්න විනෝද වේනතත් ඉඩකඩ සංවිධායක මණ්ඩලය ඔබ සඳහා සලසා තිබීම සතුටක්. මෙම හමුව සඳහා පවුලේ සෑම දෙනෙක්ම සහභාගීත්වය මිලකල නොහැකි වටිනා කමකි. එමෙන්ම ඔබගේ පවුලේ අය පමණක් නොව ඔබේ හිතවතුන්වද මේ හමුව සඳහා අපේ ශ්‍රී ලාංකිකයන් පමණක් නොව වෙනත් ජාතියකත් හෝ පැමිණීමද අපි බලාපොරොත්තු වෙමු. විශේෂයෙන් ඔබ හැම දෙනාගේ පැමිණීම උදක්ම අප ආදරයෙන් බලාපොරොත්තු වීමයි.

අපේ ආරාධනය නම් සෑම දෙනාටම කලට වේලාවට පැමිණෙන්න. පිටුපස ඇත රථ ගාලේ සියලු පහසුකම් තිබෙනවා. තවත් රථ නැවැත්වීමේ පහසුම සෙනසුරා දා දවසක් නිසා තිබෙනවා. ඔබ සැමට කිව යුතු තවත් වැදගත් කරුණක් තිබෙනවා. ඒ තමයි මෙයින් ලැබෙන සියලු ආදායම රොක්බෑන්ක් පාරමිතා බෞද්ධ විහාරයේ නව විහාර අරමුදල වෙනුවෙන් බැරකරන බව ඔබ සැමට සුහද සිතින් දන්වනු කැමැත්තෙමු. හැම ඩොලරයක්ම යොදවන්නේ මෙම දිවා රෑ පිරිසිදු වන මේ මහඟු පුණ්‍ය කටයුත්ත වෙනුවෙන්. ඉදිරි කාලයේදී නිම වීමට සැලසුම්කර ඇති මෙම විහාර කර්මාන්තය සඳහා ඔබත් දායක වුවේයැයි ඔබට දවසක සතුටු විය හැකිය.

ඔබට මේ සුහද හමුව ගැන තවත් යමක් සඳහන් කල යුතුය. එනම් මෙහි සංගීතය මෙවර ඉදිරිපත් කරන්නේ මෙල්බන්හි දක්ෂ වාදක මණ්ඩලයක් වන West Therory සංගීත කණ්ඩායමයි. එදිනට ඔබගේ සංගීතයෙන් පින වීමට ඔවුන් පුල පුලා බලා සිටී. කලින්ම මේ දිනය වෙන්කර ගන්න. මේ දවස අනෙකුත් වැඩ කරදර වලින් නිදහස් කරගෙන කලින්ම සහභාගි වන්න බලන්න. ඔබ සියලු දෙනා එකතුව සහභාගී වී මේ හමුව අර්ථවත් එකක් බවට පත් කැගැනීමේ සහාය ඔබ සතුයි.

මෙල්බන් වාසී ඔබ සැමට මේ මහඟු සුහද හමුවේදී මුණ ගැසී කතාබස් කිරීම අපේ අරමුණයි. ඔබට සුහද ආරාධනා.

දිනය - සැප්තැම්බර් 03 - 2016
වේලාව - සවස 6.00 සිට මධ්‍යම රාත්‍රිය දක්වා.
ස්ථානය - Coburg Town Hall
90 Bell Street. Coburg 3072
විමසීම් - ධනවංශ - 0469403981
ජයතිස්ස - 0416270560
රෝහන - 0416154313



ප්‍රජා ගුවන්විදුලියකට නිවේදකයකු අවශ්‍යයි

ඔබ නිවේදනයට කැමැත්තක් දක්වන තරුණයෙක් ද?
උතුරු වික්ටෝරියා ප්‍රදේශයේ
ප්‍රජා ගුවන්විදුලි සේවයක දොර ඔබට විවරව ඇත
විමසීම්
0422 671 826